# වෙළෙඳ පොළට එන මහ මුහුදේ අස්වැන්න

ශ්‍රී ලංකාව වටා ඇති මහ මුහුදු තීරයත් දිවයින තුල පිහිටි අභ්‍යන්තර ජලාශ කලපු, ගංගා සහ අනෙකුත් වැව් පොකුණු ආදියේත් තත්ත්වය සලකා බලන විට ''ධීවර සම්පත'' මෙරට ඉතාම සුලභ සහ වැදගත්, සංවර්ධන ක්‍රියාවලියේ මහත් සේ දයක විය හැකි සම්පතක් සේ පෙනී යයි. අපේ ආහාර වේලක අඩංගු වන මාළු ජනප්‍රිය ව්‍යංජනයක් වන අතර එය ආහාර වේලක අඩංගු විය යුතු පෝෂණ පදර්ථයන් අතර, මාංශ ජනක ධාතු (ප්‍රෝටීන්) ලබා දීමේ මූලාශ්‍රයක්ද වෙයි. ශ්‍රී ලංකාවේ පරිභෝජනය කරනු ලබන සත්ව ප්‍රෝටීන් වලින් 70%ක් ලැබෙනුයේ මෙරට නිෂ්පාදිත මාළු වලින්ය. වෛද්‍ය පර්යේෂණ ආයතනය සඳහන් කරන පරිදි එක් පුද්ගලයෙකු විසින් පරිභෝජනය කල යුතු යයි නිර්දේශිතව දක්වා ඇති මාළු ප්‍රමාණය වන්නේ දිනකට ග්‍රෑම් 60 ක් වශයෙන් වසරකට ඒකපුද්ගල පරිභෝජනය රාත්තල් 48 ක් ය. එහෙත් ශ්‍රී ලංකාවේ ඒක පුද්ගල පරිභෝජනය 1982 වර්ෂයේදී රාත්තල් 33 ක් වී ඇති අතර අප තවමත් මාළු පරිභෝජනය අතින් ස්වයංපෝෂිත වීමට නම් තවත් රාත්තල් 15කින් ඒකපුද්ගල පරිභෝජනය වැඩි කර ගත යුතුව

පර්යේෂණ හා පුහුණුකිරිමේ
නිලධාරී

**ටී. ඒ. ධර්මරත්න**

**විසිනි**

ඇත. එහෙයින් අප තවමත් මාළු රාත්තල් 15ක ඌන පරිභෝජන තත්ත්වයක පසුවේ. මේ පදනම මත 1982 දී ලංකාවේ මාළු අවශ්‍යතාවය ටොන් 3,21,000ක් පමණ වූ අතර 1984 දී එය දළ වශයෙන් ටොන් 3,50,000 ක් පමණ විය හැකි යයි අනුමාන වශයෙන් තක්සේරු විය. ශ්‍රී ලංකාවේ මාළු පරිභෝජන මට්ටම මාළු සපයා ගත හැකි අනෙකුත් රටවල් වල පරිභෝජන මට්ටම් වලට වඩා ඉතා පහල තත්ත්වයක පවතී. මෙයට මූලික හේතු වී ඇත්තේ ශ්‍රී ලංකාවේ මාළු නිෂ්පාදන තත්ත්වයන් ජනගහණ වර්ධනයේ තරමට ප්‍රමාණවත් නොවීම සහ අවිධිමත් මාළු වෙළඳපල, අධික මිල ගණන් සහ අධික වෙළඳ පිරිවැය, වැනි අවශේෂ කරුණු රැසකි.

## ඉල්ලුම හා සැපයුම

ශ්‍රී ලංකාවේ මාළු නිෂ්පාදනය සහ සැපයුමත්, අවශ්‍යතාවයනුත් අතර පවතින තත්ත්වයන් පිළිබඳ තුලනාත්මක විස්තරයක් මෙම සංඛ්‍යා සටහන් තුලින් පෙනේ.

මුළු මාළු සැපයුම : නිර්දේශිත මට්ටම අනුව ජාතික මාළු අවශ්‍යතාවයේ සියයට ගණන් ලෙස

| වර්ෂය | 1972 | 1973 | 1974 | 1975 | 1976 | 1977 | 1978 | 1979 | 1980 | 1981 | 1982 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ජාතික අවශ්‍යතාවය (ටොන්) | 278 | 280 | 285 | 289 | 293 | 297 | 304 | 308 | 315 | 317 | 321 |
| වෙළඳපලට සපයන ලද මුළු සැපයුම (ටොන්) | 185 | 144 | 144 | 158 | 147 | 143 | 158 | 185 | 215 | 210 | 226 |
| මුළු මාළු සැපයුම මුළු අවශ්‍යතාවයේ — ගණනක් ලෙස (ටොන්) | 66.5 | 51.4 | 50.5 | 54.6 | 50.1 | 48.1 | 51.9 | 60.0 | 68.2 | 66.2 | 70.4 |
| ඒක පුද්ගල මාළු පරිභෝජනය (රාත්තල්) | 32.0 | 24.6 | 24.2 | 26.1 | 23.9 | 22.9 | 25.0 | 28.6 | 32.7 | 31.4 | 33.2 |

මූලාශ්‍රය : ධීවර අමාත්‍යාංශය
උපුටා ගැන්ම : ආර්ථික විමසුම—1983 ජුනි

දිවයිනේ මාළු වෙළඳපල වල් පිළිබඳ එතරම් විශාල තොරතුරු සම්භාරයක් දැක්විය නොහැකි වන්නේ ඒවා ක්‍රමවත් ආකාරයක නොවීමයි. දිවයින පුරාම මාළු වෙළඳපලවල් පැතිරී තිබුනත් ඒවා නාගරික සහ කුඩා නාගරික කේන්ද්‍ර ස්ථාන මුල්කරගෙන අවිධිමත් හා අසම්පූර්ණ ආකාරයට පිහිටුවා ගෙන ඇති අතර නිශ්චිත හා ක්‍රමවත් මාළු අලෙවි වෙළඳසැල් මෙරට සුලභව දක්නට නැත. එහෙත් ඌණ සංවර්ධිත රටවලට පොදු ආර්ථික ලක්ෂණ අතර වෙළඳපලේ අවිධිමත් බව කැපී පෙනෙන ලක්ෂණයකි. ශ්‍රී ලංකාවේ මාළු වෙළඳපලේ අවිධිමත් බව මෙම කරුණ මැනවින් ඔප්පු කරනු ලබයි. එහෙත් දැනට ලංකාවේ යම්තාක් දුරට මාළු වෙළඳසැල් වලින් ප්‍රධානවන්නේ කොළඹ පිහිටුවා ගෙන ඇති තොග සහ සිල්ලර මාළු වෙළඳපලයි. දිවයිනේ අවශේෂ මාළු වෙළඳපලවල් සහ සසඳා බලන විට වැඩි මාළු සැපයුමත්, වැඩි ඉල්ලුමත් මාළු පිළිබඳ මදක්වත් හොඳ වෙළඳ පල ව්‍යුහයක් හා හොඳ වෙළඳ පරිමාවක් ඇත්තේ කෙ ළඹ පිහිටි තොග හා සිල්ලර මාළු වෙළඳ පලේය. කෙළඹ පිහිටිතොග හා සිල්ලර මාළු වෙළඳපලේ ව්‍යුහය දැඩි සංකීර්ණ තත්ත්වයක් උසුලන්නකි. එහි මිළ, සැපයුම, අලෙවිය, වැනි කරුණු බොහෝ විට ඒකාධිකාරී ස්වරූපයක් දරන අතර සංකීර්ණ වුත් විවිධ ලක්ෂණ යන්ගෙන් හෙබි වෙළඳපල ලක්ෂණ මේ මාළු වෙළඳපලින් අපට දැක ගත හැකිය. කෙසේ වුවද කොළඹ මාළු වෙළඳපලේ මුළු අලෙවි කටයුතු වලින් 90%කටත් වඩා, මිලදී ගැනීම, අලෙවිය හා සැපයුම, බෙදා හැරීම වැනි කාර්යයන්ට පුද්ගලික අංශය සම්බන්ධ වී ඇත.

## නිෂ්පාදන ප්‍රදේශ

අගනුවර මාළු වෙළඳපල සඳහා මාළු සැපයුම සම්පූර්ණයෙන්ම පාහේ පුද්ගලික වෙළඳුන් මත රඳා පවතින අතර මුළු දිවයිනේම ධීවර කර්මාන්තය පවතින ප්‍රදේශ වලින් මෙම වෙළඳපලට මාළු සැපයුම් කරනු ලබයි. දිවයින වටා පිහිටි ධීවර මධ්‍යස්ථාන වලින් සහ නිෂ්පාදනය කර එකතු කරනු ලබන නගරවලින් මාළු සැපයුම කරනු ලබයි. කොළඹට දිනපතා මාළු සපයන නගර අතර, ත්‍රිකුණාමලය, කල්මුනේ, යාපනය, පේසාලේ, මන්නාරම, කන්දකුලිය, කල්පිටිය, මාතර, බේරුවල, හලාවත, මඩකලපුව, මීගමුව, අම්බලන්තොට, වැලිගම, පානදුර සහ වෙන්නප්පුව වැනි නාගරික මධ්‍යස්ථාන ප්‍රධාන තැනක් ගනී. දිවයින වටා විසිරී ඇති මේ නගර කීපයෙන් දෛනිකව විශාල මාළු තොගයක් කොළඹ මාළු වෙළඳ පලට සපයයි. ඉන් පසුව මෙම තොග වලින් කොටසක් කොළඹ තොග වෙළඳපලින් රට අභ්‍යන්තර පිහිටි නාගරික කේන්ද්‍රස්ථාන ආශ්‍රිත වෙළඳපලවල්වලට නැවත ප්‍රවාහනය කරනු ලබයි. කැළණිය, කිරිබත්ගොඩ, තොටලඟ, බොරැල්ල, නුගේගොඩ, කිරුලපන, වැල්ලවත්ත, මහරගම, හෝමාගම, දෙහිවල, ගල්කිස්ස, රත්මලාන වැනි නාගරික ප්‍රදේශ මේ සඳහා යොදා ගෙන ඇත. මාළු තොග වෙළඳපලින් කොළඹින් ඈතට යවන ප්‍රදේශ අතර, ගම්පහ, අවිස්සාවේල්ල, මහනුවර, බලන්ගොඩ, හා රත්නපුර වැනි ප්‍රදේශ මූලික වේ.

කොළඹ පිහිටි තොග හා සිල්ලර මාළු වෙළඳපලට දෛනිකව සපයන මාළු ප්‍රමාණය නිශ්චිතව මේ යයි දැක්විය නොහැකිය, මන්ද එය විවිධ අවස්ථානුකූලව ඉතා කුඩා ප්‍රමාණයේ සිට විශාල ටොන් සංඛ්‍යාවක් දක්වා වෙනස් වන බැවිනි. කෙසේ නමුත් දිනකට දිවයිනේ නන්දෙසින් ලොරි 30–45 ක ප්‍රමාණයක් මාළු රැගෙන කොළඹ තොග වෙළඳපලට පැමිණෙයි. මෙම ලොරි සංඛ්‍යාව ඇතැම් දිනක ලොරි 45–50 ක් විය හැකි අතර ඇතැම් දිනක එය ලොරි සංඛ්‍යාව 10–18 දක්වා අඩු විය හැකි බව දක්නට ලැබේ. මෙම පදනම මත සාමාන්‍යයෙන් එක් ලොරියක මාළු ටොන් 1 හෝ 1 1/2 ක් හෝ ඊට වඩා අඩු හෝ වැඩි ප්‍රමාණයක් දෛනිකව රැගෙන එයි. එසේ නැතහොත් රාත්තල් 50–60 ත් අතර බර මාළු පෙට්ටි 200–250 ක් පමණ මෙම එක් ලොරියක ප්‍රවාහනය කරනු ලබයි. මෙම දත්තයන් මත නිශ්චිතව, කොළඹ තොග වෙළඳ පලට සපයන මාළු ප්‍රමාණය ගණනය කල නොහැකි වුවත් දෛනිකව කොළඹ තොග හා සිල්ලර මාළු වෙළඳ පලට මාළු ටොන් 30–40 ක් පමණ සැපයෙන බව දළ වශයෙන් තක්සේරු කල හැකිය. නිෂ්පාදන ප්‍රමාණයේ දැඩි විචල්‍යතාවයත්, සැපයුමේ පවතින අවිධිමත් කම නිසාත්, මෙම සැපයුම් ප්‍රමාණය නිශ්චිතව තක්සේරු කිරීම අපහසු වේ. මෙම වෙළඳපලේ මාළු සැපයුම් ප්‍රමාණයන් බොහෝ විට දිවයිනේ පවතින කාලගුණ තත්ත්වය සමග දැඩි සබැඳියාක්ව පවතින බවත් මේ අනුව කොළඹ මාළු වෙළඳපලේ මාළු සැපයුම අඩු හෝ වැඩි වන තත්ත්වයක පසු වන බව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ අලෙවි පර්යේෂණ අංශය මගින් නොයෙක්වර පෙන්වා දී ඇත. මේ පදනම මත කොළඹ මාළු වෙළඳපලේ මිල



අනෙක් සියළු වෙළෙඳ පොලවල මෙන් මාළු වෙළෙඳ පොලේද මිල තීරණය වන්නේ නිෂ්පාදනය පදනම් කරගෙනය. එහෙයින් ඈත දියඹට ගොස් මාළු රැගෙන වෙරළට එන මෙම ධීවරයෝ ඔබේ පාරිභෝජන වැඩිකිරීම්වල ස්වභාවය තීරණකිරීමේ අයිතියට යම් පමණකට හෝ හිමිකම් කියති.

ගණන්ද ඒ තත්ත්වයට අනුකූලව වෙනස් වන තත්ත්වයක් පවතින බවද මෙම අංශය මගින් පෙන්වා දී ඇත. හොඳ කාලගුණික තත්ත්වයක් පවතින විට සාමාන්‍යයෙන් සැපයුම් තත්ත්වය ප්‍රමාණාත්මකව ඉහල යන විට දළවශයෙන් මාළු මිල ගණන් පහල තත්ත්වයකට පත්වේ. දිවයිනේ කාලගුණ තත්ත්වය වෙනස් වී වර්ෂා කුණාටු සහිත නම්මෙම සැපයුම් ප්‍රමාණයන් ඉතාමත් අඩු තත්ත්වයකට පත්ව මිල ගණන් ඉහල යෑමේ ප්‍රවණතාවයක් පවතී. කොළඹ තොග හා සිල්ලර මාළු වෙළඳපලේ මාළු සැපයුම පිළිබඳව හා මිල ගණන් පිළිබඳව සාමාන්‍ය උපනතිය මෙයයි.

## අධික මිල

ශ්‍රී ලංකාවේ අවශේෂ ප්‍රදේශ වල මාළුවල මිල ගණන් හා කොළඹ තොග හා සිල්ලර වෙළඳපලේ මාළු මිල ගණන් දෙස තුලනාත්මකව බලන විට පැහැදිලිව කැපී පෙනෙන ලක්ෂණය වන්නේ කොළඹ වෙළඳපලේ 'අධික මාළු මිල' ගණන් පැවැතීමය. මාළු වෙළඳපලේ මාළු වල මිල වැඩි වීමට වඩාත් ප්‍රබල බලපෑම් කලේ සැපයුම් පාලනය තමන් සතුව ඇති පුද්ගලික මාළු වෙළඳුන් විසිනි. 1964 දී ධීවර සංස්ථාව පිහිටු වීමේ මූලික අරමුණු වලින් එකක් වූයේ සාධාරණ මිලකට මාළු අලෙවි කිරීම සහ බෙදා හැරීම ක්‍රමවත්ව පවත්වා ගැනීමයි. එසේ වුවත් වඩා හොඳ සංවිධාන ශක්තියකුත්, මූල්‍යමය වශයෙන් ලාභ ලබන තරඟකාරී වූත් ක්‍රියා කලාපයක් අත්කර ගැනීමට මෙම සංස්ථාව අසමත් වූ හෙයින් ධීවර වෙලඳපලේ තත්ත්වයන් පාලනය කිරීම පුද්ගලික අංශ අතේ දිගින් දිගටම පවතින අතර අතරමැදියා හෙවත් වෙලෙන්ඳා මුදලාලි ක්‍රියා කලේ උපරිම ලාභයක් ලබා ගැනීම උදෙසාය. මෙහි අනිවාර්ය ප්‍රතිඵලය වූයේ මාළු මිලේ අධික වැඩි වීමය. මේ හේතූන් නිසා අවම නිෂ්පාදන මිල සහ උපරිම පාරිභෝගික මිල යන මූලධර්මය ශ්‍රී ලංකාවේ මාළු වෙලඳපල ආශ්‍රිතව එතරම් සාධාරණව සහ උචිත පරිදි

ක්‍රියාත්මක වී නැත. මේ හේතූන් නිසා කොළඹ මාළු මිල සාමාන්‍ය යෙන් ඉහල මට්ටමක පැවතීමට අවශ්‍ය පරිසරය සකස් විනි.

1972 දී රාත්තල් 32 ක් වූ ඒකපුද්ගල මාළු පරිභෝජනය 1978 දී රාත්තල් 25 දක්වා පහල වැටුනි. මෙයට මූලික හේතුව වූයේ මාළු නිෂ්පාදනය හා සැපයුම පහත වැටීමය. මේ තත්ත්වය වඩාත් උග්‍ර වීම වැලකුනේ වැඩි තොග ආනයනය කිරීම නිසාය. විශේෂයෙන්ම මෙරට ජන ගහනයේ අධික වර්ධනයක් සහිත ඉල්ලුම ඉහල යැමත් සැපයුමේ හිඟයත් මේ ආකාරයෙන් මාළු මිල තියුණු ලෙස ඉහල නැංවීමට තුඩු දුනි. අනික් අතට තරඟකාරී සත්ව මාංශ ජනක ආහාර වල මිල ඉහල යැමත් ආහාරයක් ලෙසට මාළුවල ඇති ජනප්‍රියතාවය වසරින් වසර වර්ධනය වීමත්, ඉහල නැඟියන ආදයම් කාණ්ඩ බහුල වීමත්, විශේෂයෙන්ම වසර ගණනාවක්ම තිස්සේ පැවැති තදබල මිල උද්ධමනාත්මක ප්‍රවනතා පැවැතීමද මෙරට මාළු මිල ගණන් ඉහල යැමේ සාධකයට මහත්සේ දයකවිනි. මේ තත්ත්වය තුල අතරමැදියාට ඔහුගේ ලාභාන්තිකය වැඩිකර ගැනීමට හැකිවූ අතර මාළු සැපයුමේ තදබල හිඟයක් පැවැති විට මාළු මිල සාමාන්‍ය මට්ටමටත් වඩා ඉහලින් පැතිර පැවැතුනේය. අනෙකුත් ජනප්‍රිය ආහාර ද්‍රව්‍ය සම්බන්ධයෙන් මෙන් නොව මාළු සම්බන්ධයෙන් ගත්කල වෙලඳපලට බලපෑමටත් ඉහල යන මිල ගණන් පහල දැමීමටත් ආරක්ෂක තොග සපයා ගත නොහැකිය. ධීවර අමාත්‍යාංශ ය 1979–1983 පස් අවුරුදු ධීවර සැලැස්ම කෙටුම්පත් කරන ලද අවස්ථාවේ තීරණය කලේ එම සැලැස්මේ අරමුණු අතර ආයෝජන දිරි දීම, මාළු සැපයුම ස්ථාවර කිරීම හා වැඩි දියුණු කිරීම වැනි කරුණුය. විශේෂයෙන්ම 'පාරිභෝගික මිල සීමා කිරීම' යන්ත්‍රයක් ලෙස ක්‍රියා කිරීමේ අපේක්ෂාව පෙරදැරි කර ගෙනය. මේ අනුව මාළු මිල වැඩි වීම පසුගිය වර්ෂ කීපය තුල සාමාන්‍ය මිල උද්ධමන අනුපාතයට සමව හෝ ඊට අඩුවෙන් පවතී යයි අපේක්ෂා කලත් මාළු මිල වැඩි වූයේ, මිල උද්ධමන අනුපාතිකයට කිසිසේත්ම සමාන ආකාරයට නොවේ.

## මිල තීරණය

කොළඹ තොග වෙලඳපලේ මාළු මිල' තීරණය වීමේදී බලපාන තවත් සුවිශේෂ සාධක රැසක් දැක්විය හැකිය. මේවා අතර නිෂ්පාදන මිල විශේෂ වැදගත් කමක් ගනී. නිෂ්පාදන මිල පදනම් වී ඇත්තේ අදාල වියදම් වූ මෝටර් බෝට්ටු, යාන්ත්‍රික වෙනත් බෝට්ටු, යාත්‍රා හා වෙනත් තාක්ෂණික උපකරණ, ඉන්ධන, ගාස්තු යනාදිය සඳහා වැය වූ පිරිවැයත් මත්ස්‍ය සම්පත සුලභ හෝ දුලබ වීමත්, ඒ අනුව සැපයුම් ප්‍රමාණය තීරණය වීමත්, යන කරුණු මතය. මාළු මිල තීරණය වීමේදී වැදගත්ම සාධකය වන්නේ අතරමැදියා සමග නිෂ්පාදකයා පවත්වන වෙලඳපල වගකීම සහ බැඳීමය. එය බොහෝ විට අතර මැදියා යොදා ඇති මුදල් ප්‍රමාණය මත කේවල් කිරීමේ හා මාළු මිල තීරණය කිරීමේ ශක්තිය තීරණය වේ. ඊට අමතරව මාළු මිල තීරණය වීමේදී 'වෙලඳ පිරිවැය' වැදගත්ය. මේ යටතේ ප්‍රවාහන කුලී, අයිස් දැමීමේ වියදම්, පැටවීම හා බෑම සඳහා වැය කල මුදල්, සහ පොලී ආදී කරුණු වැදගත් වේ. අන් අතට මාළු මිල තීරණය වීමේදී බලපාන තවත් වැදගත් සාධකයක් වන්නේ 'පාරිභෝගික රුචිය සහ සිල්ලර වෙලඳපලේ පවතින තරඟකාරී ක්‍රියාකාරිත්ව යත්ය.' මෙම කරුණු මූලික වශයෙන් මාළු මිල තීරණය ක්‍රියාත්මක වනු ලැබේ.

මෙයට අමතරව මාළු මිල තීරණය වීමේදී බලපාන කරුණු රැසක් දැක්විය හැකිය. 'ලාභ තීරුව' තවත් එවැනිම සාධකයකි. පුද්ගලික අංශය තම මනාපයන් පරිදි තීරණය කර ගන්නා 'ලාභය මාළු මිල ඉහල නැංවීමේදී විශේෂ තත්ත්වයක් උසුලන බවයි. මේ ආකාරයට කොළඹ වෙලඳපලේ මාළු මිලට බලපාන සාමාන්‍ය සාධක රැසක් ද සොයා ගතහැකිය. මේවා බොහෝ විට මිල තීරණය කිරීමෙහිලා තීරණාත්මක හේතු වශයෙන් හෝ ආන්තික හේතු වශයෙන් සළකනු ලැබේ. මේ යටතේ නයිලෝන් දැල් වලින්

## මිල අඩුවීම

අල්ලා ගන්නා ලද මාළු වල මිල සාමාන්‍යයෙන් අඩුය. මෙයට හේතුව වී ඇත්තේ එම දැල් වලින් අල්ලන ලද මාළු තැලීමෙන් හා කැපී යැමෙන් එහි තත්ත්වය බාල වීමය. මෙය දෛනික මිල තීරණය වීමේදී බොහෝ විට තීරනාත්මක බලපෑම් කරනු ලැබේ. තවද අයිස් යොද ගබඩා කර තිබූ මාළු වල මිල ගණන් සාමාන්‍යයෙන් අඩුය. මෙය හේතුව වන්නේ එම මාළු කල්පමා වීමෙන් හා අයිස් යොද තැබීම නිසා එහි තත්ත්වය එතරම් යෝග්‍ය නොවීමය. මාළු මිල තීරණය වීමේදී තවත් විශේෂ සාධකයක් වන්නේ එය ප්‍රවාහනය



නිෂ්පාදන කටයුතුද දියුණුවන ලෝකයත් සමඟ ඇති සංකීර්නත්වයට පත්වී ඇත. එද මෙන් නොව අද පාරිභෝජන අවශ්‍යතා සීග්‍රයෙන් ඉහළ යෑම නිසා නව තාක්ෂණික උපයෝගි කරගැනීම මගින් නිෂ්පාදනය වර්ධනය කිරීමට අවශ්‍යවේ. මේ මාළු නිෂ්පාදනයට උපයෝගි කරගන්නා නව බෝට්ටු සමූහයකි.

කරන ලද ප්‍රදේශයයි. මේ යටතේ පේසාලේයි, යාපනය, කල්මුනේ, මුලතිව් වැනි දුර බැහැර ප්‍රදේශ වලින් ගෙන එන ලද මාළු මිල අඩුය. මෙම මාළු මිල අඩුවීමට බලපාන්නේ ප්‍රවාහනය කල යුතු දුර ප්‍රමාණය ඉතාමත් අධික නිසා එයට සෑහෙන කාලයක් ගතවීමයි. මේ නිසා සිදු වන කල් පමාව නිසා මාළු වල තත්ත්වය අයෝග්‍ය වීම හා තත්ත්වය බාලවීම, මිල තීරණය වීමේදී තදින් බලපානු ලැබේ. අන් අතට බටහිර වෙරලේ නිෂ්පාදන ප්‍රදේශ වලින් හා කොළඹට තදසන්න ප්‍රදේශ වලින් මෙම වෙලඳපලට පැමිණෙන මාළු මිල ගණන් සාමාන්‍යයෙන් අධික වේ. මේ කාරණයට හේතුව වන්නේ එම මාළු ඉක්මනින් ප්‍රවාහනය කිරීමත්, අයිස් නොයොදා තිබීමත් ඉක්මණින් පාරිභෝගිකයන් අතට පත්කල හැකි වීමත්, ක්ෂණිකව වෙලඳපලට ඉදිරිපත් කිරීමත්, කල් පමා නොවීමත්ය, යන කරුණුය. යථෝක්ත කරුණු බොහෝ අවස්ථා වල කොළඹ මාළු වෙලඳපලේ මාළු මිල තීරණය කිරීමේදී තීරණාත්මකව බලපානු ලැබේ.

දිවයිනේ මාළු මිල ප්‍රාදේශීය වශයෙන් විමර්ශනය කරන විට සාමාන්‍යයෙන් ''ප්‍රාදේශීය විචල්‍යතාවයක්'' දක්වයි. මේ ප්‍රදේශීය මිල විචල්‍යතාවය පසුපස පැවැති සාධකයද ඉතා පැහැදිලිය. කොළඹ මාළු මිල සාමාන්‍යයෙන් අධික

වන්නේ ඉල්ලුම අධික නිසාය. වෙරලබඩ ධීවර මධ්‍යස්ථාන වලින් ප්‍රධාන වශයෙන්ම අග නගරයට මාළු සැපයුම් පවතින නිසා මෙහි මිල ගණන් සෑම විටම ඉහල මට්ටමක පවතී. එහෙත් ඇතැම් අවස්ථාවල හොඳ කාළගුණ තත්ත්වයක් යටතේ අධික සැපයුම මේ මාළු මිල පහල දැමීමට හේතු වෙයි. අන් අතට කාලගුණය අයහපත් වී අඩු සැපයුම මාළු මිල ඉහල නැංවීමේ සාධකය ලෙස ක්‍රියාත්මක වේ. මේ යටතේ අවශේෂ ප්‍රදේශ වලද මාළු මිල ඉහල දැමීමට මෙය හේතුවක් වෙයි. උදාහරණයක් ලෙස කළුතර සහ මන්නාරම වැනි ප්‍රදේශ වල අධික සැපයුම හේතු කර ගෙන තෝරා, පරව්, බලයා යන මාළුවල මිල ගණන් බොහෝ අවස්ථාවල අඩු බව පෙන්නුම් කරයි. මේ අනුව කොළඹ මාළු වෙලඳපලේ 'ඉහල මිල නිෂ්පාදනයෙන් පහල මට්ටම සහ අධික ඉල්ලුම හේතු කොට ගෙන ඇති වූ අතර දිවයිනේ අවශේෂ ප්‍රදේශ වල මාළු මිල පහල මට්ටමක පැවැතීමට හේතු වූයේ අධික නිෂ්පාදනය සහ පහත් මට්ටමේ ඉල්ලුම හේතු කරගෙනයි.

## කරුණු තුනක්

කොළඹ මාළු වෙලඳපලේ මාළු ඉල්ලුම තුලද විශේෂ ලක්ෂණ කීපයක්ම ඇත. මෙම ඉල්ලුම රටාවේ මූලික කරුණු තුනක් මෙහි දී හඳුනා ගත හැකිය.

(1) ව්‍යාපාරික ආයතන, සංචාරක හෝටල්, දේශීය ආපන ශාලා, මේ වැනි ආයතන වලින් ඉල්ලුමේ විශාල කොටසක් සමන්විත වන අතර මේ ආයතන බහුල වශයෙන් ඉස්සන්, කෙලවල්ලා, මෝරා, තෝරා, බලයා, වැනි මාළු වර්ගයන් බහුලව ඉල්ලුම් කරති. කොළඹ මාළු වෙලඳපල ආශ්‍රිත සමස්ත ඉල්ලුමේ සංයුතියෙන් දල වශයෙන් 20% ක් පමණ මේ ආයතන වලින් සංයුක්ත වී ඇති බව අනුමාන ලෙසට තක්සේරු කල හැකිය.

(2) මෙම කොටසට අයත් වන්නේ කොළඹ හා තදසන්න ප්‍රදේශ වල ඉහල ආදයම් සහ ඉහල පරිභෝජන හැකියාවන් ඇති සමාජ කණ්ඩායමයි. මේ කාණ්ඩය තුල ද බහුල වශයෙන් ඉස්සා, බලයා, තෝරා, මෝරා වැනි මාළු වර්ග සඳහා වැඩි ඉල්ලුමක් පවතින අතර මුළු ඉල්ලුමේ සංයුතියෙන් 10% ක් පමණ මේ අංශය දයක වී ඇත.

(3) තුන්වන කාණ්ඩය නම් සාමාන්‍ය පහල ආදයම් ලබන සාමාන්‍ය ජන කොට්ඨාශයයි. මොවුන් අතර මාළු වර්ග තේරීම පිළිබඳ එතරම් පැහැදිලි සැලකිලිමත් වීමක් නැත. පොදුවේ සියළුම වර්ග සඳහා හොඳ ඉල්ලුමක් ඇත. මුළු ඉල්ලුමෙන් 3/4 ක් පමණ එනම් 70% ක් පමණ මේ අංශයේ පරිභෝජනයට ගැනේ.


## ඉල්ලුම් රටාව

දිවයිනේ අභ්‍යන්තර ප්‍රදේශවල මාළු මිල පිළිබඳ එතරම් පැහැදිලි නිවැරදි දත්ත සපයා ගත නොහැකිය. එම නිසා එම මිල ගණන් කොළඹ මාළු වෙලඳපලේ මිල ගණන් සමග සංසන්දනය කිරීම දුෂ්කර වේ. කෙසේ වුවද සැපයුමේ අඩුකම හා දුර්ලභත්වය සහ බෙදහැරීමේ පිරිවැය අධික වීම නිසා රටමැද ප්‍රදේශ වල මාළු මිල ගණන් ද සෑම විටම වෙරල බඩ ප්‍රදේශ වල මාළු මිල ගණන් වලට වඩා සාපේක්ෂව සාමාන්‍යයෙන් අධික වේ. කොළඹ මාළු වෙලඳපලේ ඇති ක්‍රියාකාරිත්වය සමග සම්බන්ධිත තවත් මූලික ලක්ෂණයක් වන්නේ අගනුවර ''බිත්තර වෙලඳපලයි.'' සාමාන්‍යයෙන් මාළු මිල ඉහල යෑමත් සමගම බිත්තර ඉල්ලුම වැඩිවේ. මෙය මිල පහල යන විට බිත්තර ඉල්ලුම අඩුවේ. මෙකී උපනතීන් කොළඹ මාළු වෙලඳපලේ 'ඉල්ලුම් රටාව' සම්බන්ධව ඇති ක්‍රියාකාරිත්වයයි.

## ප්‍රතිසංස්කරණයක්

එහෙයින් කොළඹ නරගයේ හා දිවයිනේ මාළු වෙලඳපල අතර මැදියා වෙලඳුන් විසින් පාලනය කරන විෂම චක්‍රයක් තුල කටයුතු කිරීම දිගින් දිගටම රඳා පවතී. මාළු වල අධික මිල ගණන් නිසා එහි නියම 'මුල්‍යම ලාභය' ලැබී ඇත්තේ ධීවරයන්ට හෝ පාරිභෝගිකයන්ට නොව අතරමැදියන් හෝ වෙලඳුන්ටය. මේ නිසා දිවයිනේ මාළු වෙලඳපල රටාව පුළුල් ප්‍රති සංස්කරණයකට භාජනය විය යුතුය.

මේ සම්බන්ධව ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තය ආශ්‍රිතව වෙලඳපල දියුණු කිරීම උදෙසා සැලසුම් රැසක් යෝජනා කර ඇත. මේ අතර 1979–1983 අතර ක්‍රියාත්මක වූ පස් අවුරුදු ධීවර සංවර්ධන සැලැස්ම ඉතා ම වැදගත් වේ. එහෙත් මේ සැලැස්මෙන් බලාපොරොත්තු වූ පරමාර්ථයන් ඒ ආකාරයටම ඉටු වී නැති බව ධීවර කර්මාන්තය ආශ්‍රිත ප්‍රතිපත්ති සම්පාදනයන්ගේ ඇතැම් ප්‍රකාශ වලින් සනාථ වේ. මේ සැලැස්මේ දක්වා ඇති පරිදි



..........''සැපයෙන මාළු ප්‍රමාණය සීඝ්‍රයෙන් පහත බැසීමත්, මිල අධික ලෙස ඉහල යෑමත්, නිසා මෑත වර්ෂ වල පාරිභෝගික යන් පරාජයට පත් වී ඇත. මෙම නැමියාවන් ස්ථිරවම වෙනස් කිරීමට මම අදහස් කර සිටිමි....''

පෙස්ටස් පෙරේරා,
ධීවර අමාත්‍ය,
ධීවර අමාත්‍යාංශයහු1983 මාර්තු
ශ්‍රී ලංකා ධීවර සංවර්ධන සැලැස්ම
1979–1983

මේ යටතේ මෙරට මාළු වෙලඳ පලේ පුළුල් සහ නිශ්චිත ප්‍රති සංස්කරණයක අවශ්‍යතාවය ප්‍රතිපත්ති සම්පාදකයන් දූන් හඳුනාගෙන ඇත. මේ යටතේ ක්‍රමවත් ප්‍රවාහන පද්ධතියක් සහ මනා ලෙස සංවිධානය වූ බෙද හැරීමේ රටාවක් සහ සාධාරණ මිල ගණන් වලින් යුක්ත විධිමත් වෙලඳපල ව්‍යුහයක් අවශ්‍ය බව පෙනී යයි. කෙසේ නමුත් ඉතාමත් විධිමත් වෙලඳපල ව්‍යුහයක් මාළු වෙලඳපල දියුණු කිරීම සඳහා අවශ්‍ය බව මෙහිලා පෙන්වා දිය හැකිය. එය සංවර්ධනය වේගන යන ශ්‍රී ලංකාව වැනි රටක උසස් පරිභෝජන රටාවක් ඇති කිරීමෙහි ලා මහත්සේ දයක වනු ඇත.

එසේම මෙරටේ විසඳීමට ඇති බරපතල ප්‍රශ්නයක් වන රැකීරක්ෂා හිභය විසඳීමෙහිලා මෙබඳු වැඩ වෙලකින් යම් පමණකට හෝ ආධාර ලැබෙනු නිරනුමානයි.